# අධ්‍යාපන අමාත්‍යාංශය

## උසස් අධ්‍යාපන අංශය

## විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා අංගසම්පූර්ණ ඉංජිනේරු පීඨයක් සහ කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සඳහා තාක්‍ෂණ පීඨ තුනක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව (ADB) මඟින් අරමුදල් සපයනු ලබයි. ව්‍යාපෘති මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 165 කි. ව්‍යාපෘති කාල සීමාව 2018 සිට 2024 වසර දක්වා වේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම | ආයතනය |
|---|---|---|---|
| ප්‍රසම්පාදන විශේෂඥ | 01 | PS3 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) |

ඉහත තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ පොදු කොන්දේසි පහත පරිදි වේ.

**අවශ්‍ය සුදුසුකම්**

**01. ප්‍රසම්පාදන විශේෂඥ - PS3**

**පහත (i), (ii) හෝ (iii) අවම සුදුසුකම් හා පළපුරුද්ද:**

(i) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

සමඟ

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබීම

(ii) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

සහ

අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් පශ්චාත් උපාධියක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයක පූර්ණ සාමාජිකත්වය / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තිමය සුදුසුකමක් ලබා තිබීම

සමඟ

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබීම.

(iii) රජයේ දීප ව්‍යාප්ත සේවාවක පළමු පංතියේ නිලධාරියෙකු හෝ අදාල ක්ෂෙත්‍රයේ ඒ හා සමාන තනතුරක නිලධාරියකු වීම

සමඟ

පළමු පංතියේ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 04ක පලපුරුද්දක් ලබා තිබීම.

<u>පොදු කොන්දේසි</u>

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**1.වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 64ට අඩු වීම

2. වැටුප :

2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හා අදාළ සංශෝධන අනුව හිමි වැටුප සහ අනෙකුත් දීමනා

3. **සේවා කොන්දේසි**:

නිලධාරීන් වසරක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ඇත. කාර්ය සාධනය හා සේවයේ අවශ්‍යතාව අනුව එම කාලය වසරින් වසර තවත් වසර තුනක උපරිම කාලයක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

**4.අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :**

2021 ජූලි 31

**5.වෙනත් ප්‍රතිලාභ:**

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවදායකයාගෙන් 8% ක දායකත්වයක් ද, සේවායෝජකයාගෙන් 12% ක දායකත්වයක්ද සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් සේවායෝජකයා විසින් ද දරනු ඇත.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින්, අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව තමන් විසින් සකස් කරන ලද අයදුම්පත, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාර දීම සිදු කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**363 E, හොරහහකන්ද පාර,**
**තලංගම උතුර,**
**කොස්වත්ත,**
**බත්තරමුල්ල.**

**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය
**2021.07.15**